**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් මස 18 වන දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 17,531.71 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 16,987.66 ක් උපයෝජනය කර තිබුණි. දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 544.04 ක් හෙවත් සියයට 3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 17,213.64 | 16,677.19 | 536.45 | 3.11 |
| මූලධන | 318.06 | 310.47 | 7.59 | 2.51 |
| එකතුව | 17,531.71 | 16,987.66 | 544.04 | 3.10 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් දෙපාර්තමේන්තු විසින් එකතුව රු.මිලියන 141.88 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 117.87 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 24 ක් හෙවත් සියයට 16.92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 400.00 | 374.80 | 285.00 | 312.33 | 1,000.00 | 77.98 |

**2.3 පොදු තැන්පත් ගිණුම** -

දෙපාර්තමේන්තුව යටතේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 02 ක ශේෂවල එකතුව රු.මිලියන 303.78 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0002/0061/000 | 1.02 |
| 6000/0000/00/0018/0017/000 | 302.76 |
| එකතුව | **303.78** |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වු අංක 7002/0000/00/0396/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 56,766 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ

සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයෙහි දැක්විය යුතු තොරතුරු යාවත්කාලීන කර සම්පූර්ණ කර නොතිබුණි.

### 3.2 වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විදුලි වැට ඉදිකිරීමට අදාල ආරක්ෂක මුර කුටි ඉදිකිරීම සඳහා රු.මිලියන 84.22 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එයින් රු. මිලියන 83.18 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වලට සමගාමීව 001-2-6-2502 වැය විෂය සඳහා රු.7,663,875 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය පහත දැක්වේ.

| වැඩසටහන | ලබා දුන් ප්‍රතිපාදනය | 2016 දෙසැම්බර් 31 දිනට වියදම | 2016 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ▪ මතින් නිදහස් රටක් ජාතික වැඩසටහන කොළඹ | 341,775 | 341,775 | - |
| ▪ මධ්‍යම පළාතේ බස් රථ ප්‍රවාහන සේවය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ නියමු ව්‍යාපෘතිය | 6,615,000 | 6,461,000 | 154,000 |
| ▪ මතින් නිදහස් රටක් ජාතික වැඩසටහන කුරුණෑගල සහ කළුතර | 707,100 | 461,500 | 245,600 |
| **එකතුව** | **7,663,875** | **7,264,275** | **399,600** |

මීට අමතරව පාරම්පරික වී අස්වනු මිලදී ගැනීමට ලබාදී තිබුණු රු. මිලියන 50.00 ක ප්‍රතිපාදනවලින් දිවයින පුරා පිහිටා ඇති බලකා මට්ටටමින් රු. මිලියන 27.43 ක් වැය කර වී මිලදී ගෙන තිබුණි. ඉතිරිවූ ප්‍රතිපාදන පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලය දැනුවත් කර ආපසු යවා තිබුණි.

**3.3** **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | - | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළපසු ඉතිරිය ඉක්මවා රු.42,770,300 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | 140,000 | අවස්ථා 03 කදී ලබා දී තිබුණු අත්තිකාරම් නියමිත පරිදි පියවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 753 | - | භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් අදාල පොදු ආකෘති පත්‍ර මඟින් සටහන් කර නොතිබුණි. |

**3.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2015 ඔක්තෝබර් 22 දින ලැන්ඩ් රෝවර් වර්ගයේ රථයක් අළුත් වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩරය පිලියන්දල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතනයක් වෙත රු.1,658,375ක මුදලකට පිරිනමා තිබුණි. එම වාහනය 2016 මැයි 30 දින අළුත් වැඩියා කටයුතු සාර්ථකව නිම කර නැවත වාහනය දෙපාර්තමේන්තුව වෙත භාරදුන් බවට වාහන නඩත්තු භාර නිලධාරී විසින් සහතික කර තිබුණි. කෙසේ වෙතත්, 2016 මැයි මාසයට අදාල දෛනික ධාවන සටහන් පරීක්ෂාවේදී මෙම රථය දෙපාර්තමේන්තුවේ විශ්වමඩු කාර්යාලයේ ලුතිතන් කර්නල්වරයකුගේ රාජකාරී සඳහා අනුයුක්ත කර තිබුණි. 2016 මැයි 01 දින සිට මැයි 31 දක්වා කි. මී. 3960 ක් ධාවනය කර තිබුණු බවත් ඒ සඳහා ඉන්ධන ලීටර් 514 ක් භාවිතා කර තිබුණු බවත් අනාවරණය විය.

(ආ) 2016 වර්ෂයේ මැයි මාසයේ ඇතිවූ හදිසි ගංවතුර තත්වයේදී සහන කණ්ඩායම් ලෙස ක්‍රියා කළ සිවිල් ආරක්ෂක භටයින් 900 දෙනෙකුගේ ප්‍රයෝජනය සඳහා ගමන් ගුදිරි 900 ක් හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා මිලදී ගැනීමට මිල ගණන් කැඳවා තිබුණි. දින 07 ක් තුළ සැපයීමට අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු වෙනත් ආයතන නොසලකා වඩා ඉහල මිල ගණන් ඉදිරිපත් කර

තිබුණු සැපයුම්කරුවකුට දින 03 ක් ඇතුළත භාණ්ඩ සැපයීම සඳහා ටෙන්ඩරය පිරිනමා තිබුණි. ඒ අනුව පිරිවැය රු. මිලියන 1.49 කට විශාල ප්‍රමාණයේ ගමන් ගුදිරි 500 ක් හා මධ්‍යම ප්‍රමාණයේ ගමන් ගුදිරි 400 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.කෙසේ වෙතත් එම භාණ්ඩ සපයා තිබුණේ දින 49 ක කාල ප්‍රමාදයකින් පසුවය. ඒ හේතුවෙන් අදාල භාණ්ඩ සඳහන් කල හදිසි අවශ්‍යතාවයට ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. පසුව එම භාණ්ඩ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වැලිසර, කැබිතිගොල්ලෑව, කටුනායක, පොළොන්නරුව හා වෙන්නවත්ත පිහිටි කඳවුරු ගබඩා වෙත නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 49.04ක පිරිවැයක් දරමින් කැන්වස් සපත්තු ජෝඩු 35,000 ක් මිලදී ගෙන තිබුණි. 2016 අප්‍රේල් 11 දින සැපයුම්කරු සමඟ ගිවිසගත් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අදාල සැපයුම් 2016 සැප්තැම්බර් 08 දිනට පෙර සම්පූර්ණ කළ යුතු විය. එසේ වුවත් සපත්තු ජෝඩු 16,525 ක් මාස 03 කට වැඩි කාල ප්‍රමාදයකින් පසුව සපයා තිබුණි. තවද, සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට දින දෙකකට පෙර එනම් 2016 අප්‍රේල් 09 වන දින රු. මිලියන 6.85 ක් වටිනා කැන්වස් සපත්තු ජෝඩු 5,000 ක් දෙපාර්තමේන්තුව වෙත කල්තබා ලබා ගෙන තිබුණි. එමෙන්ම මෙම මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කළ කාර්ය සාධන බැඳුම්කරය 2016 ඔක්තෝම්බර් 05 දිනෙන් අවසන් වී තිබුණු නමුත් 2016 දෙසැම්බර් 08 දින වන විටත් එහි කාලසීමාව දීර්ඝ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 අවිධිමත් ගනුදෙනු**

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8. 9. 1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500, 000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීමකදී සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවත්, පහත සඳහන් මිලදී ගැනීම් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත මොරටුව මෝල්පේ නව පාලන කඳවුරෙහි ඉදිකිරීමට නියමිත ගොඩනැගිලි සඳහා පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 4’x8’ප්‍රමාණයේ ප්ලයිවුඩ් ෂීට් එකක් රු. 3,390 බැගින් ප්ලයිවුඩ් ෂීට් 390ක් රු.මිලියන 1.47ක (වැට් සහිත) මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදීගෙන තිබුණි.

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානය සහ මොණරාගල බලකාය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 13 ක් මිල දී ගැනීම සහ සවිකිරීමේ වියදම් වෙනුවෙන් රු.මිලියන 1.14ක (වැට් සහිත) මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි .

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් සියළුම බලකා සහ පුහුණු පාසල් සඳහා අවශ්‍ය සෙ.මී. 100 x 150 ප්‍රමාණයේ දෙපාර්තමේන්තු ධජ 400ක් එකක් රු. 4,375 බැගින් රු. මිලියන 1.75ක මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදීගෙන තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව, ක්‍රීඩා වර්ණ ප්‍රදාන උත්සවයකට සහභාගී වීමට අවශ්‍ය සිවිල් ඇඳුම් ලබාදීම සම්බන්ධ රු.මිලියන 2.37 ක මුදලක් වැය කර තිබුණු කොන්ත්‍රාත්තුව සම්බන්ධව සැපයුම්කාර ආයතනය වෙතින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

## 3.6 පාඩු හා හානි

----------------

2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වාහන අනතුරු හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද හානි වටිනාකම රු.179,820 ක් විය.

## 3.7 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව සිදුකර තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 8.76 ක පිරිවැයක් දරමින් සේවා නියුක්ත භටයින් සඳහා ග්‍රීන් (Green) සහ ඩෙසර්ට් (Desert) යනුවෙන් වූ දෙපාර්තමේන්තු ලාංඡන 60,000 ක් මිලදී ගෙන තිබුණි. ඒ වන විටත් දෙපාර්තමේන්තුවට අයත් වෙන්නවත්ත ගබඩාව තුල ග්‍රීන් (Green) සහ ඩෙසර්ට් (Desert) යන දෙපාර්තමේන්තු ලාංඡන පිළිවලින් 18,153 ක් සහ 16,804 ක තොගයක් පැවතුණි. තවද, දෙපාර්තමේන්තුවේ සේවා නියුක්ත භටයින් ගණන 38,819 ක් වූ අතර, අවශ්‍යතාවයට වඩා ලාංජන 17,319 ක් මිල දී ගෙන තිබුණි. ඒ අනුව මේ සඳහා රු.මිලියන 2.28 ක අමතර වියදමක් දරා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 2015 මාර්තු 31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව පාරිභෝගික අධිකාරිය විසින් කි.ග්‍රෑ.50 සිමෙන්ති මල්ලක උපරිම සිල්ලර මිල රු.870 ක් බව ප්‍රකාශයට පත් කර තිබුණු නමුත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල හා පුහුණු කඳවුරු ව්‍යාපෘති සඳහා සිමෙන්ති මළු 2,500 ක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වූ මිල ගණන් අතුරින් අවම මිල ඉදිරිපත් කල ආයතනයෙන් එකක් රු. 990 බැගින් සිමෙන්ති මළු 2,500 ක් මිලදී ගැනීමට රු.මිලියන 2.48 ක් ගෙවා තිබුණි. ඒ අනුව උපරිම සිල්ලර මිල හා සැසඳීමේදී සිමෙන්ති මල්ලකට රු.120 බැගින් මළු 2500 ක් සඳහා රු.300,000 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. සිමෙන්ති මළු 2500 ක් වැනි විශාල තොගයක් මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ සාකච්ජා කර වට්ටම් ලබා ගැනීමෙ හැකියාව සම්බන්ධයෙන්ද සලකා බලා නොතිබුණි. සැපයුම් කරු සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව 2015 නොවැම්බර් 30 දින වන විටත් සිමෙන්ති මළු සියල්ල සපයා අවසන් කළ යුතු වුවද එදින වන විටත් සපයා තිබුණේ සිමෙන්ති මළු 1,370 ක් පමණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ධජ 400 ක් මිල දී ගැනීම වෙනුවෙන් රු. මිලියන 1.75 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණු අතර, සැපයුම්කරු විසින් ධජ 200 ක් දින 60 ක කාල ප්‍රමාදයක් සහිතව සපයා දී තිබුණි. 2014 දෙසැම්බර් මාසයේ දී දෙපාර්තමේන්තු ධජ 200 ක් මිලදී ගෙන තිබියදීත් 2016 වර්ෂයේදී නැවත දෙපාර්තමේන්තුව ධජ 400 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 14 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 84 | 59 | 25 | - |
| (iii) | ද්විතියික මට්ටම | 21 | 16 | 05 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40,060 | 38,565 | 1495 | - |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 09 | - | 09 |
| | **එකතුව** | **40,188** | **38,663** | **1,534** | **09** |